**ශීර්ෂය 195 - කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

---

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අක්මුදල් ගැලපුම් ගිණුමේ වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු විසින් දරන ලද වියදම රු.59,625,872ක් විය. එසේ වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව මූ.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු විසින් දරන ලද වියදම රු.59,789,046 ක් ලෙස දක්වා තිබුණෙන් රු.163,174ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු බව. | පෙන්වා දී ඇති වෙනස පිළිබඳව පරීක්ෂාකර බැලීමට සටහන් කරගත් බව. |

**1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 (1) , 104 (3) හා 104(4) | වාහන අනතුරු 04 ක් සම්බන්ධයෙන් දින 07 ක් ඇතුළත ඉදිරිපත් කල යුතු ප්‍රාරම්භක වාර්තාව හා මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කල යුතු පූර්ණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත දිනවලදී අදාළ වාර්තා ඉදිරිපත් කල යුතු බව. | වාහන අනතුරු සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ වාර්තාව හා අවසාන පරීක්ෂණ වාර්තාව ඉදිරියේදී අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙනඇති බව. |
| (ආ)2010 ජූලි 09 දිනැති අංක සීඒ/1/1/16/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය | අමාත්‍යාංශයේ නිලධාරීන් 07දෙනෙකු විදේශ සංචාරය නිමකර පැමිණි පසු චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉදිරිපත්කල යුතු වාර්තා නියමිත කාලය තුල ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරිපත්කල යුතු වාර්තා නියමිත කාලය තුල ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු බව | ඉදිරියේදී මෙවැනි ප්‍රමාද වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර අදාල නිලධාරීන් ඒ පිළිබඳව දැනුවත්කර ඇති බව. |
| (ඇ)2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහන 24 කින් වාහන 22 ක ඉන්ධන දහන පරීක්ෂා කිරීම සිදු කර නොතිබුණි | රජයේ සෑම වාහනයකම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසු හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් සිදුකළ | අමාත්‍යාංශය සතු සංචිත වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර ඇති බව. |

| | | | |
|---|---|---|---|
| | | යුතු බව. | |
| (ඇ)2017 දෙසැම්බර් 31 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | වෙනත් පාර්ශවයන් සතු වාහන 4 ක් විධිමත් අනුමැතියකින් තොරව භාවිතයට ගෙන තිබුණි. | ලියාපදිංචි අයිතිය නොමැති වාහන, ලියාපදිංචි අයිතිය ඇති ආයතනයේ එකඟතාවය මත තම ආයතනයේ නමින් ලියාපදිංචි කරගැනීමට හෝ ලියාපදිංචි අයිතිය ඇති ආයතනය වෙත විධිමත්ව පවරා දීමට කටයුතු කළ යුතු බව. | වාහන 2 ක් පවරාගැනීම සඳහා අදාල අමාත්‍යාංශය වෙත යවා ඇති බව සහ ඉතිරි වාහන 2 සම්බන්ධ කටයුතු ඉතා ඉක්මනින් අවසන් කිරීමට සටහන් කරගත් බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ සැලැසුම් කල පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිමය හා ඉල්ලුම් කළ අග්‍රිමය අතර රු. මිලියන 6,984 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, එය සැලැසුම් කල පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිමයෙන් සියයට 395 ක වැඩිවීමකි. එසේම ඉල්ලුම් කළ අග්‍රිමය හා ලැබුණු අග්‍රිමය අතර රු. මිලියන 6,400 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එය ඉල්ලුම් කළ අග්‍රිමයෙන් සියයට 73 ක අඩුවීමකි. | නිසි පරිදි අග්‍රිමය සැලසුම්කලයුතු අතර සැලසුම්කල පරිදි අග්‍රිම ඉල්ලුම් කල යුතු බව. | චක්‍රලේඛ ප්‍රකාරව පිළියෙළකරනු ලබන අක්මුදල් සැලසුම අතිරේක ප්‍රතිපාදන ලැබීම මත හා මාසිකව අයදුම්කරන අක්මුදල් ප්‍රමාණය නිසිපරිදි නොලැබීම මත නැවත නැවත අයදුම්කරන බැවින් එලෙස වෙනසක් සිදුවන බව. |

## 2.2 වියදම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------- | ----------------------- | ----------------------------------- |
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 06ක ශුද්ධ ප්‍රතිපාදනයේ වියදම රු. 356,911,703 ක් විය. ඒ අනුව ඉතිරි රු. 90,283,797 ක් වීමෙන් එය සියයට 11ක සිට සියයට 100ක් දක්වා අතර පරාසයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු බව. | වියදම් නිසිලෙස කළමනාකරණය කිරීම, ගැලපුම් දීමනාව වැටුපට එකතු කිරීම, අපේක්ෂිත දායක මුදල් ගෙවීම සඳහා ඉදිරිපත් නොවීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ගැටළු මතුවීම, නියමිත පරිදි භාණ්ඩාගාරයෙන් අක් මුදල් නොලැබීම යන කරුණු හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වූ බව |
| (ආ) | මූලධන වැය විෂයයන් 09ක ශුද්ධ ප්‍රතිපාදනයේ වියදම රු. 2,152,814,809 ක් විය. ඒ අනුව ඉතිරි රු. 2,456,602,690 ක් වීමෙන් එය සියයට 15ක සිට සියයට 85ක් දක්වා අතර පරාසයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු බව. | ජාතික අයවැය චක්‍රලේඛ 5/2019 හි 03 වගන්තිය පරිදි ප්‍රමුඛ නොවන ව්‍යාපෘතින් හා මෙතෙක් ආරම්භකර නොමැති අයවැය යෝජනාවල ඇතුලත් ව්‍යාපෘති හා අත්‍යවශ්‍ය නොවන ගෘහ භාණ්ඩ කාර්යාලීය උපකරණ ආදී අයිතමයන් මිලදී ගැනීම වෙනුවෙන් වූ වියදම් කපා හැරීම සිදු කිරීම හේතුවෙන් මූලධන ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුවී ඇති බව. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------- | ------------------ | -------------------------------------- |
| වැය විෂයයන් 20ක ඉතුරුම් ඉක්මවා රු.17,691,101 ක බැරකම් වලට එකග වී තිබුණි. | බැරකම් වටිනාකම ඉතිරිවීම් නොඉක්මවිය යුතු බව. | අත්‍යවශ්‍ය හා කල් දැමිය නොහැකි සේවාවන් වෙනුවෙන් එලෙස බැඳීම් ඇතිකරගෙන ඇති බව. |

## 2.4 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව නිකුත් කරනු ලැබූ තත්කාර්යය අතුරු අග්‍රිමය අදාල විශේෂිත කාර්යයට ආසන්නතම දිනයකදී නිලධාරියා වෙත ලබාදිය යුතු අතර නිලධාරියා විසින් එම කාර්යය නිම කල විගසම අග්‍රිමය පියවිය යුතුය. එසේ වුවද අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකු අවස්ථා 2 ක දී ලබා ගත් රු. 65,000 ක තත්කාර්යය අතුරු අග්‍රිම පියවීම සඳහා දින 35 ක සිට දින 54 ක් දක්වා කාලපරාසයක් ගතකර තිබුණි. | තත්කාර්ය අතුරු අග්‍රිමය අදාල විශේෂිත කාර්යය ආසන්නතම දිනයකදී නිලධාරියා වෙත ලබාදියයුතු අතර නිලධාරියා විසින් එම කාර්යය නිමකල විගසම අග්‍රිමය පියවිය යුතු බව. | අත්තිකාරම් පියවිමේදී විවිධ හේතූන් මත ප්‍රමාදවීම් සිදුවී ඇතිබවත් ඉදිරියේදී එම තත්ත්වයන් වලක්වා ගැනීමට පියවර ගෙන ඇති බවත්. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුව ලැප්ටොප් පරිගණක මිලදීගැනීම සඳහා රු.3,000,000 ඇස්තමේන්තු කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුල ලැප්ටොප් මිලදී ගැනීම සඳහා රු.6,156,000 ක් වැය කර තිබුණි.ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම හා සැසඳීමේදී තත්‍ය වියදම සියයට 105 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කිරීමේදී නිවැරදිව ඇස්තමේන්තු කල යුතු බව. | උපාධිධාරීන් බඳවා ගැනීමේ වැඩසටහන යටතේ බඳවා ගත් සංවර්ධන නිලධාරීන් ගෙන් රාජකාරී වඩාත් ඵලදායී ලෙස ඉටුකර ගැනීමේ අරමුණින් පැවති ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ලැප්ටොප් පරිගණක යන්ත්‍ර මිලදීගෙන ඇති බව හා මෙම තත්ත්වයන් හැකිතාක් දුරට මගහරවා ගැනීමට ක්‍රියාකරනු ලබන බව. |

## 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අමාත්‍යාංශය සතුව පැවති වාහන 08 ක් වෙනත් ආයතන නමින් ලියාපදිංචි කර තිබුණු අතර, එම වාහන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කල යුතු බව. | අදාල මෝටර් රථ අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. |
| (ආ) අමාත්‍යාංශය සතු වාහන 03ක් විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය හා ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යාංශ වෙත මුදාහැර තිබුණි. | වාහන මුදා හැරීමේදී අමාත්‍යාංශයේ අරමුණු ඉටු කිරීමට බාධාවක් නොවන පරිදි එම වත්කම් විධිමත්ව පවරාදීමට කටයුතු කළ යුතු බව. | මෝටර් රථ 2ක් එවකට රාජ්‍ය අමාත්‍යවරයාගේ හා අනෙක් රථය හිටපු අමාත්‍යාංශ ලේකම්තුමියගේ රාජකාරී අවශ්‍යතාව මත මුදාහරින ලද අතර එම වාහන නැවත අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව. |

## 3.3 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | විදේශීය වැඩමුළු සඳහා නිලධාරීන් තෝරාගැනීමේ කමිටුවක් 2019 වර්ෂයේදී පත්කර තිබුණද, අවස්ථා 06 කදී විදේශ ගමන් සඳහා නිළධාරීන් තෝරාගැනීම උක්ත කමිටුව මගින් සිදුකර නොතිබුණි. | විදේශීය පුහුණු/සම්මන්ත්‍රණ/වෙළඳ ප්‍රදර්ශන හා වැඩමුළුවලට අමාත්‍යාංශයේ නිලධාරීන් තෝරා ගැනීම අදාල කමිටුව මගින් සිදුකල යුතු බව . | ඉදිරියේදී එම තත්වයන් වලක්වා ගැනීමට පියවරගත් බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මිල්ලනිය අපනයන සැකසුම් කලාපයේ ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත්කර ගැනීමට පෙර හා ලිඛිත ගිවිසුම්වලට එළඹීමකින් තොරව යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ලංකා විදුලිබල මණ්ඩලය යන ආයතන වෙත සමාලෝචිත වර්ෂය තුළදී රු.1,988,918,307 ක් ගෙවා තිබුණි. එසේ වුවද, අපනයන සැකසුම් කලාපය ඉදිකිරීම සඳහා පවරා ගැනීමට යෝජිත ඉඩම සම්බන්ධයෙන් බාහිර පාර්ශවයක් විසින් ගනු ලැබූ අධිකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු අත්හිටවා තිබුණි. | ඉඩම් අත්පත්කර ගැනීමෙන් පසුව යටිතල පහසුකම් සඳහා ගෙවීම් කිරීමට කටයුතුකල යුතු බව. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ඇ) | බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් ලිඛිත ගිවිසුම්වලට එළඹීමකින් තොරව මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය යන ආයතන වලට සමාලෝචිත වර්ෂය තුළදී අමාත්‍යාංශය විසින් රු.499,333,030 ක මුදලක් ගෙවා තිබුණි. | ගෙවීම් කිරීමට පෙර ලිඛිත ගිවිසුම්වලට එළඹිය යුතු බව. | කෙටුම්පත් ගිවිසුම් එක් එක් ආයතන වෙත ඉදිරිපත්කර ඇති අතර ඉදිරියේදී ගිවිසුම්වලට එළඹීම සඳහා කටයුතු යොදා ඇති බව. |

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| තිරසාර සංවර්ධන අරමුණු ලගාකර ගැනීම යටතේ අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් Provide Infrastructure Facilities for Industrial Park in Millaniya, Establish Industrial Zone in Bingiriya, Provide Infrastructure facilities for Industrial Zone in Wagawatta සහ Multinational Corporation Outreach Program for Electrical and electronics Manufacturing Industry යන වැඩසටහන් 4 හි අපේක්ෂිත ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි. | සැලසුම් කල ක්‍රියාකාරකම් සඳහා අපේක්ෂිත ප්‍රගතිය ලගාකර ගැනීමට කටයුතු කල යුතු බව. | අධිකරණ ක්‍රියාමාර්ග, ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආශ්‍රිතව සිදුවූ අනපේක්ෂිත ප්‍රමාදයන් ,අවශ්‍ය අනුමැතින් ලබා දීමට දීර්ඝ කාලයක් ගත වීම, අපේක්ෂිත ලෙස අරමුදල් මහා භාණ්ඩාගාරයෙන් නොලැබීම, යෝජිත ඉඩම් එම කාර්යයන් සඳහා නිදහස් කර ගැනීමේදී සිදු වූ ප්‍රමාදය, මහජන විරොධතාවය, අයහපත් කාලගුණික තත්ත්වයන්, අමාත්‍ය මණ්ඩල තීරණයන් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය ලබා දී ඇති නිරීක්ෂණවල පැවති අවිනිශ්චිතතාවය යන හේතු මත අදාල ව්‍යාපෘතිවල සමස්ථ ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට ලගාකර ගත නොහැකි වූ බව. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 236 ක් වූ අතර පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 70 ක් විය. | ආයතනයේ පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු කල යුතු බව | සමස්තයක් ලෙස ගත්විට උපාධිධාරී පුහුණු අභ්‍යාසලාභී නිලධාරීන් ලෙස 64 දෙනෙකු අමාත්‍යාංශයේ හා අපනයන සංවර්ධන මණ්ඩලය හා ඊට අනුයුක්තව ප්‍රාදේශීය කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රාජකාරී කටයුතු ඉටුකරනු ලබන හෙයින් පුරප්පාඩු පිරවීම සිදුකල හැක්කේ ඔවුන් අදාල තනතුරුවල ස්ථිර කිරීමෙන් අනතුරුව බව. |
| (ආ) වර්ෂයේ පුහුණු කාල රාමුවට අනුව ද්වීතියික ශ්‍රේණිවල නිලධාරීන් සඳහා පැවැත්විය යුතු වූ පුහුණු වැඩසටහන් 03ක් සඳහා නිලධාරීන් සහභාගී කර නොතිබුණි. එසේම, කණිෂ්ඨ ශ්‍රේණිවල නිලධාරීන් සඳහා සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් 06 ක් එම නිලධාරීන්ගේ කාර්යයයන් කෙරෙහි ඍජු සම්බන්ධතාවයක් නොපැවතුනි. | වර්ෂයේ පුහුණු කාලරාමුවට අනුව අදාල පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් සහභාගී කරවිය යුතු බව සහ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීමේදී එක්එක් ශ්‍රේණිවලට අයත් නිලධාරීන්ගේ සේවා අවශ්‍යතාවයන් අනුව පුහුණු වැඩසටහන් සැලසුම් කල යුතු බව. | ඉදිරියේදී එම නිරීක්ෂණ අනුව කටයුතු කිරීමට සටහන් කර ගත් බවත් ඒ පිළිබඳව සැලකිලිමත් වන ලෙස නිලධාරීන් දැනුවත් කල බවත්. |
| (ඇ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.1 ඡේදය ප්‍රකාරව ආයතනික කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුල සහතිකවිය යුතු වුවද, | චක්‍රලේඛ ප්‍රකාරව ආයතනික කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුල සහතික විය යුතු බව. | එක් එක් නිලධාරීන්ගේ රාජකාරී පැවරීම අනුව සහ ඒ ඒ නිලධාරීන්ගේ ඉල්ලීම අනුව රජයේ පුහුණුවීම් ආයතන මගින් ලබාදෙනු ලබන පුහුණු අවස්ථා සඳහා නිලධාරීන් යොමුකර ඇති බවත් සියළු නිලධාරීන් සඳහා බැහැරගත පුහුණු වැඩසටහනක් සැලසුම්කර තිබූ බවත්. |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී කිසිදු පුහුණුවක් නොලද නිලධාරින් ගණන 159ක් විය. | | |
| (ඈ) වර්ෂයේ ධාරිතා සංවර්ධනය සඳහා වූ රු.400,000 ක ප්‍රතිපාදනයෙන් රු.209,000ක් වැය කර නිලධාරීන් 236 දෙනෙකුගෙන් නිලධාරින් 17 දෙනෙකු සඳහා පමණක් පුහුණුව ලබාදී තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ආයතනික කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුල සහතික විය යුතු බව. | පිළිතුරු ලබාදී නොමැත. |